# 9. කෘෂි කර්මාන්තය හා බැඳි උපසංස්කෘතික භාෂාව

සහකාර කථිකාචාර්ය අසිත ප්‍රභාත් මල්ලවආරච්චි

සමාජයට අනුගතව පවතින්නාවූ යම් යම් හැසිරීම් රටාවන් එකී සමාජය විසින්ම පිළිගැනීමට ලක් කරනු ලැබේ. එමෙන්ම ඇතැම් හැසිරීම් රටාවන් එම සමාජය තුළ පවතින විවිධ විරෝධතාවන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මේ ආකාරයට එකිනෙකා අතර පැවතිය යුතු හැසිරීම් රටාව තීරණය කරනු ලබන චර්යා ප්‍රකාරයන් හේතුකොටගෙන සමස්ත සමාජයම සාමූහිකව බැඳී තිබේ. සමාජයේ සාමූහික ජීවිතය මඟින් ඉස්මතුව පෙනෙන මෙම ගුණය සංස්කෘතිය ලෙස හැඳින්වීමට පුළුවන.

සංස්කෘතිය පිළිබඳව අධ්‍යයනය කිරීමේදි සමාජය යන සංකල්පය ද අතිශය වැදගත් වේ. රැල්ප් ලින්ටන් දක්වන ආකාරයට "සමාජයක් යනු සංවිධානය වූ පුද්ගල සමූහයකි." "සංස්කෘතිය යනු කිසියම් විශේෂිත වූ සමාජයක දැකිය හැකි ප්‍රතිචාරයන්ගේ පවතින ස්භාවය වේ." එය පරම්පරාවෙන් පරම්පරාවට උරුම වන්නාවූ විවරණයකි. මේ හේතුව නිසාම විවිධ විද්වතුන්ගේ අවධානයට සංස්කෘතිය ලක් ව ඇත.

### සංස්කෘතිය පිළිබඳ නිර්වචන

සංස්කෘතිය හෝ සභ්‍යත්වය යනු දැනුම, ඇදහිලි, කලා, නීති සදාචාර, සිරත් විරිත් හා මිනිසා සමාජයේ ජීවත්වන පුද්ගලයෙකු වශයෙන් ලබා ගන්නා වූ පුරුදු ඇබ්බැහිකම් හා හැකියාවන් අඩංගු සංකීර්ණ සමස්ත සමුදායයි.

-ඊ බී ටයිලර් -

සංකේතානු සාරයෙන් සමාජීය ලෙස හිමිකරගන්නා වූද, පාරම්පරික වශයෙන් අත්පත් කොට ගත්තාවූද සියලුම චර්යා රටාවන්ට දිය හැකි, සාමූහික නාමය සංස්කෘතිය වේ.

-චාල්ස් ඒ එල්වුඩ -

සංස්කෘතිය වනාහි එක් අතකින් සංකේතාත්මකවූත්, අනෙක් අතින් අඛණ්ඩවූත් අලුත් අලුත් දෑ ඉක්මනින් සාධනය කර ගන්නාවූත් ප්‍රගතිශීලි ක්‍රියාදාමයකි.

-ලෙස්ලි ඒ වයිට් -

මේ අනුව මිනිසා හා බද්ධව ගමන් ගන්නාවූ සමාජයේ පවතින්නාවූ භාෂාව, ඇදහිලි, විශ්වාස, ආගම, ධර්මය, පාලන තන්ත්‍රය, සිරිත් විරිත්, සාහිත්‍ය ආදී සියල්ලම සංස්කෘතියේ අංග ලෙස සැලකිය හැකිය. එමෙන්ම සංස්කෘතිය වූ කලී වෙනස්වන සමාජ ස්වරූපයක් ලෙස අධ්‍යයනය කිරීමට පුළුවන.

ඒ අනුව සංස්කෘතිය යන වචනයෙන් අදහස් කරන දෙය තේරුම් ගැනීම ඉතා අපහසුය. සංස්කෘතිය නම් සකස් කොටගනු ලබන දෙයකි. වෙනත් වචනවලින් පැහැදිලි කළහොත් එහි තේරුම හැඩගැස්ම යන්නයි. අධ්‍යාත්මික වූත්, බාහිරවූත් හැඩගැස්වීමක් ඇත්නම් එය සංස්කෘතියයි. සංස්කෘතිය හෝ සභ්‍යත්වය යනු දැනුම, ඇදහිලි, කලා, නීති සදාචාර, සිරත් විරිත් හා මිනිසා සමාජයේ ජීවත්වන පුද්ගලයෙකු වශයෙන් ලබා ගන්නා වූ පුරුදු ඇබ්බැහිකම් හා හැකියාවන් අඩංගු සංකීර්ණ සමස්ත සමුදාය ලෙස ඊ. බී. ටයිලර් විසින් දක්වා ඇත. මේ අනුව මිනිසා හා බද්ධව ගමන් ගන්නාවූ සමාජයේ පවතින්නාවූ භාෂාව, ඇදහිලි, විශ්වාස, ආගම, ධර්මය, පාලන තන්ත්‍රය, සිරිත් විරිත්, සාහිත්‍ය ආදී සියල්ලම සංස්කෘතියේ අංග ලෙස සැලකිය හැකිය. එමෙන්ම සංස්කෘතිය වූ කලී වෙනස්වන සමාජ ස්වරූපයක් ලෙස අධ්‍යයනය කිරීමට පුළුවන. සමාජයක පවත්නා පොදු සිතුම් පැතුම් හා බාහිර ක්‍රියා මෙන්ම පරම්පරාවේ විශේෂ ලක්ෂණ ඇත්නම් එබදු ලක්ෂණ ද සංස්කෘතිය ලෙස හැදින්වේ.

- කථා ව්‍යවහාරය හා භාෂාව.
- පරිහරණය කරන ලද දේවල්.
- ජන කතා හා මිත්‍යා විශ්වාස.
- විද්‍යාත්මක බුද්ධිය.
- කලා ශිල්ප.
- ගෘහ ජීවිතය හා සමාජය.
- ආර්ථික ක්‍රමය හා තත්වය.
- පාලන ක්‍රම.
- යුද්ධ ක්‍රම හා අවි ආයුධ.

යන මේවා එකින් එක විග්‍රහ කර බැලුවහොත් ඒ ඒ ජාතින්ට පමණක් ආවේණික වූ ලක්ෂණ දැකගත හැකිය. (විමලවංශ නාහිමි, බද්දේගම, (2000). පිටුව 11) ඒ සියල්ලම සංස්කෘතියට අයත් වේ. එමෙන්ම මෙම අවයව එකක් හෝ

කිහිපයක් පදනම් කරගෙන සංස්කෘතිය යන මහා බලවේගය කුඩා උපකුලකයට බෙදී යයි. මෙම බෙදීම තුළින් අවසානයේ ඒ ඒ ආකාරයේ උප සංස්කෘතීන් සමාජය තුළ ස්ථාවර වී ඇත. මෙලෙස ලාංකීය සමාජය තුළ පවතින ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රමය වන වී වගාව කේන්ද්‍රකරගෙන ද අපට සංස්කෘතියක් නිර්මාණය වී ඇත. මෙහිදී එම කෘෂිකර්මාන්තය හා බැදී උපසංස්කෘතියෙහි පවතින්නාවූ භාෂාව පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් කොට සැලකිය හැකිය.

චීනයේ ක්‍රි. පූ. 200 ට පෙරද, යුරෝපයේ 8 වන සියවසේද, වී වගාවේ සුලමුල පිළිබඳ විවිධ මතභේද නැත්තේ නොවේ. ඒ අනුව වී වගාව ගොවිතැන් කටයුතුවල ආරම්භය තෙක්ම දිවයයි. ඉතාලියේ වී වගාව පිළිබඳව තොරතුරු හමුවන්නේ 1468 දිය. දකුණු හා අග්නිදිග ආසියාවේ වී වගාව එකම කාල පරිච්ඡේදයක ව්‍යාප්ත වූ බවට සලකනු ලැබේ. ක්‍රි. පූ. 1084 දී ජාවා හා අවට දූපත්වලට ඉන්දියාවේ සිට වී වගාව ව්‍යාප්ත වී තිබේ. මධ්‍යම ආසියාවට පංජාබ් දේශයෙන් වී වගාව පැතිරෙන්නට ඇති අතර ක්‍රි. පූ. 500 දී පකිස්ථානයේ හා දකුණු උස්බෙකිස්ථානයේ වී වගාව සිදු කළ බවට තොරතුරු වාර්තා වේ. 17 වන සියවසේ අග භාගයේ පටන් ඇමරිකා එක්සත් ජනපදයේ වී වගාව කෙරෙන නමුත් මුල්ම උත්සහය 1909 දී වර්ජිනියාවේදී කළ බව සදහන් වේ. 18 වන සියවසේ රුසියාවේ අස්ත්‍රාහාන් උද්භිද උද්‍යානයේදී වී වගා කෙරිණි. නැගෙනහිර හා දකුණු ප්‍රදේශයන්වල සිට සෝවියට් දේශය තුළද වී වගාව වර්තමානයේදී සිදු කෙරේ.

සාමාන්‍යයෙන් නිවර්තන කලාපීය භෝගයක් ලෙස ආසියාවේ බොහෝ රටවල ව්‍යාප්ත වී ඇත්තේ එහි සංස්කෘතියේ අංගයක් ලෙසය. පැරකුම් රජ දවස සහලින් ස්වයංපෝෂිත වූ අප පිටරටවලටද සහල් අපනයනය කළෙමු. වසරකට තුන් කන්නයක් වී වගා කළ බවට තෝනිගල සෙල්ලිපියේ පිටදඩහස, අකලහස, හා මැදෙහස යන වචනවලින් සනාථ වේ. ලංකාවේ ගොවිතැන ආරම්භ වූයේ විජය රජුගේ පැමිණීමටත් බොහෝ කලකට පෙරය. නමුත් එය ක්‍රමවත් වූයේ විජයාගමනයෙන් පසුව බව පෙනේ. ඉතිහාසයේ කියවෙන පරිදි ආර්යයන් ගොඩ බැසීමත් සමග උතුරු ඉන්දියානු ගොවිතැන් ක්‍රමයන් මේ රටේ පැතිරෙන්නට පටන් ගත්තේය. පසුව ඒ ක්‍රමය ලංකාවට සුදුසු පරිදි සකස් විය. ලංකාවේ ශාස්ත්‍රානුකූලව වැව් බැදීම පණ්ඩුකාභය රජුගේ කාලයෙහි ඇරඹුණා යැයි අනුරාධපුරයේ අභය වැව සාක්ෂියෙන් හෙළිදරව් වේ. වැවයි දාගැබයි සිංහල සංස්කෘතියේ මුදුන් මල්කඩ වූයේ දේශීය ජන ජීවිතය හැඩගැස් වූ බලවේගය කෙතයි, බුද්දහමයි වූ බැවින්ය. ඒ අනුව සාරධර්ම, සිරිත්විරිත්, සිතුම් පැතුම්, ආකල්ප, විශ්වාස, ඇදහීම්, ප්‍රතිභාව, වින්දනය හා තාක්ෂණය යන ගුණාංග

සියල්ලම ගොවිකම, ආගම දහම හා මුහුන් වී ඇත. සිංහලුන්ගේ කෙතෙන් උපන් දෙයකි. කෙතට දිය සපයන අමුණ බැඳීමේ සිට අස්වනු කපා පාගා වී බිස්සට රැස්කරන තෙක් ගොවිතැන හා බැඳි සිරිත් විරිත් සමුදායකි. මෙම සිරිත් විරිත් පද්ධතිය තුළින් විදහා දක්වන්නේ සිංහලයාගේ සමඟිය, අන්‍යොන්‍යතා සබඳතාව, කරුණාව, දයාව, පරිත්‍යාගශීලිබව, නිහතමානිකම, ඉවසීම, කෘතගුණ දැක්වීම ආදි වාණිජත්වයෙන් කිළිටි නොවූ සිංහල ගැමියාගේ ජීවන සෞන්දර්යයි.

අන් ජාතීන් පරයන චින්තනයක් අපේ ජාතීන් සතුව පැවති බව ඉතිහාසය පිරික්සනවිට පැහැදිලි වේ. ජල සම්පාදනයෙහි කැටි වූ විද්‍යාත්මක ඥානය මෙන්ම වෙහෙර විහාර ඉදිකිරීමේදී අප සතු වූ ඉංජිනේරු ඥානය, විශ්ව පූජිත වූ අපේ කලා නිර්මාණ තුළින් පළ කෙරෙන බුද්ධිම ප්‍රතිභාව දේශීය ජාතික චින්තනය වේ. අපේ සාහිත්‍ය ඔස්සේ ගලා ගියේ එම චින්තන ධාරාවයි. අතීත රජ දවස අපගේ ජාතික චින්තනය ගොඩ නැගුණේ කුඹුරේ, ලියද්දේ, නියරේ, වක්කඩේ, ඉපනැල්ලේ හා කමතේ ස්පර්ශයෙනි. ඒ ඔස්සේ ගොඩනැගුණු භාෂාව සංස්කෘතිය වී ඇති අතර වර්තමානය වන විටඑය වියැකියයි. එහෙයින් එම උප සංස්කෘතික භාෂාව අධ්‍යයනය කිරීමට මෙම ලිපිය පිටිවහලක් වනු ඇත. කුඹුරු යන වදන "කේදාර" යන වචනයෙන් බිඳී ආවකි. කේදාර කුවුරු වී, කුවුරු අවසානයේ කුඹුරු බවට පරිවර්තනය වී ඇත. නමුත් ප්‍රාදේශිය වශයෙන් මෙම කුඹුරු විවිධ නාමයන්ගෙන් හඳුන්වනු ලැබේ.

අකරහ කුඹුරු - උතුරු මැද පළාතේ ව්‍යවහාර වෙයි.වගා නොකළ හැකි අසාර මුඩු ඉඩම් මේ නාමයෙන් හැදින්වෙන්නේ ය. අකරහ යනු අකෘෂ්‍ය ශබ්දයෙන් ආ හැකිය. කෘෂි කර්මයට අයෝග්‍ය යන්නයි.

අගාර කුඹුරු - මාතර පළාතේ නම් ජල බහුල එරෙන කුඹුරු මේ නාමයෙන් හැදින්වෙන්නේය.

අගම්පඩි කුඹුරු - යුද සේවය සඳහා ම වෙන්ව සිටි අභ්‍යන්තර බටයන්ට දුන් කුඹුරු මේ නාමයෙන් හැදින්වෙන්නේය.

අටවරල - කුරුණෑගල ලිස්සායන මඩවත් වන්නියේ ලිස්සා යන මඩ ඇති කුඹුරටත් අටවරල යයි කියති.

අඳ කුඹුරු - අඳයට වගා කරන කුඹුරු අඳ කුඹුරු නම් වේ. "අඳ" ශබ්දය "අඩ" යන ශබ්දයෙන් ආ හෙයින් අඩ යන ශබ්දය දෙකෙන් කොටස යන අදහස දේ.

අනහු - ජල බහුල පෙදෙස මෙන්ම ගස් වැල් බහුල පෙදෙසකි.

අත්තපඩුවු - මුලින් තමා සතුව තිබී පසුව අනුන් සන්තක වූ
වූ ඉඩම් ගොඩ මඩ ඉඩම්වලට මෙම නාමය ව්‍යවහාර වේ.

අසුවැද්දුම - කුඹුරක් හෝ කුඹුරු යායක් සමීපයේ ඇති ගොඩබිමක් කපා හදා කුඹුරක් කල විට ගොවියා එය මේ නමින් හඳුන්වයි. එය අමුතුවෙන් අස්වද්දන ලද යන අරුත ගෙන දේ.

ඉරපලු - පළලින් අඩු දිගින් වැඩි කුඹුරු වලට මේ නම යොදයි. මාතර ප්‍රදේශයේ ඉරි කොළ නමින් මීට සමාන කුඹුරු විශේෂයක් ඇත.

උෟරු බිම - මුහුද සමීපයේ තිබෙන ලවණ රසය නිසා වගා නොකළහැකි බිම මෙ නමින් හඳුන්වයි.

සාරත්වය අනුව කුඹුරක් කොටස් කළ විට සාරත්වය අඩුම කොටස 'පැස්සේ තරම' ලෙසද එයට අයත් කුඹුරු 'පැසි කුඹුරු' ලෙසද හඳුන්වයි. 'කට්ටකඩු' යන්න ඊටම සමාන වදනකි. කඩුගන්නාව ප්‍රදේශයේ කුඩා ලියැදිවලින් යුක්ත කුඹුරු 'කන්දැති කුඹුරු' නමින් හඳුන්වයි. මාතර ප්‍රදේශයේ අතින් අතට මාරු වන කුඹුරු 'කරමාරු කුඹුරු' වන අතර කැලෑ ශුද්ධ කළ කුඹුරු 'කැළලි කුඹුරු' වේ. එමෙන්ම පූජ්‍ය පක්ෂයට වෙන් කළකුඹුරු 'ගණේ කුඹුරු' වේ.

කුඹුරක් වපුරා යෝග්‍ය කිරිම, 'කම්පස් කිරිම' නම් වේ. ඉන් අනතුරුව පළමුවෙන්ම වතුර බැඳීම 'වප්පැන' ලෙස හඳුන්වයි. වප්පැනෙන් කුඹුරු තෙම් ගිය විට 'පුරන් කෙටීම' හෝ 'සී සෑම' ඇරඹෙන්නේය. ප්‍රථමයෙන්ම කුඹුර කෙටීම මාතර පළාතේ 'පුරන් කෙටීම' ලෙසත් අනෙකුත් පළාත්වල 'පලුමං කෙටීම' ලෙසත් හඳුන්වයි. පිරිසක් එක්ව කෙටීම 'කරළි කෙටීම' නම් වෙයි. පුරන් කොටා සතියක් දෙකක් ඉක්ම වූ පසු 'අන්දන්තලේ ගසා', වෙලි සෑස, 'දෙකවුන් කෙටීමත්' ඉක්බිති 'වෙලි බැඳිමත්' ඉනික්බිති 'කැට පෑගිමත්' සිදු වන්නේය. උදැල්ලෙන් කුඹුරු කම්පස් කිරිම මෙපරිද්දෙන් සිදු වේ.

සී සෑමේදි නගුල, ගොන් ගෙය සහ ගොවියා යන තුන් කොටසම වැදගත් වේ එහිදි නගුල ප්‍රධාන වේ. විවිධ ප්‍රදේශයන් හි භාවිතා වන නගුල් වර්ගයන් හා නගුල් වලට භාවිත කරනු ලබන නම් වෙනස්ය.

අඩක්කලප්පු නගුල - හතර ලියැද්දේ භාවිත කරන ලොකු නගුල

කොකු ගනුල - මඩ බහුල කුඹුරු සෑම සඳහා භාවිත කෙරේ

දිවත් නගුල - දිවතින් යුක්ත නගුල දිවත් නගුල නම් වේ. මඩ අධික කුඹුරුවලට යෝග්‍යය.

තිමුත් කුරුල්ලා - මී අගින් සාදා තිමුතේ හයි කරන ලද කැටයෙක් මේ නමින් හඳුන්වයි.

බඩවත නගුල - මිටත් නගුලිසත් දෙකම මදක් ඇතුළට නැමුණ සේ සාදන ලද නගුල් විශේෂයකි.

මීට අමතරව නගුලෙහි අඩංගු උපකරණ කොටස්ද විවිධ නම් වලින් හඳුන්වනු ලැබේ. එනම්,

අමුතු පට්ටය - නගුලිසත් විය ගසත් එකට අල්ලා බඳින ලණුව

කොරවක් කොටේ - නගුලිසේ මුල නගුලිසටත්, නගුල් දතටත්, අතර ගසන ලී කැබැල්ල

නගුලිස - බරකරත්තයක ඊරියකද මෙන් විය ගහ බැඳීම පිණිස පාවිච්චි කරන නගුලේ ප්‍රධාන කොටස

නගුල් මිට - සී සෑමේදී ගොවියා විසින් අල්ලා ගනු ලබන කොටස වේ

නගුල් දත - නගුලේ දතක් මෙන් තිබෙන බිම සෑරීගෙන යන අවයවය නගුල් දත නම් වේ

සී වැල - වක්කත්තේ ගසනු ලබන යකඩ පටිය

හමනාව - වක්කත්තේ මැදින් සිදුරක් කොට නගුලිසේ මුල අසුවන සේ වේ වැලෙන් බැම්මක් බැඳීම සිදු කරයි හමනාව යනු එයයි

| | |
|---|---|
| උඩලේ | - නගුලේ මුදුන් පැත්තට නමකි |
| ඉයලම්බාත | - නගුලට දමන වළල්ලකි |
| නාපල්ල | - නගුලේ යට පැත්ත, එය කැපීමට නාව විදිම යයි කියති |
| ඉහත් තිල්ල | - නගුලේ ඉහළ පිල්ල |
| පලු ඇණය | - ඇදී නොයනු පිණිස කොරවක් කටේ පසුපස ගසන ඇණය |
| වෙන | - තිමුත් කුරුල්ලා ගසන තැන |

(දළුපොත, (2002) 27 පිටුව)

සී සෑම අරඹන ගොවියා ප්‍රථමයෙන්ම කුඹරේ ඇළ මං සාදා ගෙවැඩිය යුතුය. නැකතට වැඩ ඇල්ලීම 'ගෙවැඩීම ' ලෙස හඳුන්වයි. අමුඩය ගසා ලේන්සුව ඔළුවේ බැදමල් කැරු කෝටුව දකුණතිනුත් නගුල් මිට වමතිනුත් රැගෙන කුඹුරට බසිති. මේ ආකාරයට පළමුවෙන්ම සාන සීය "බිම් නැගුම, පුරන් මඩ" යන නමින්ද, දෙවන හීය "දෙමඩුව" නමින්ද තෙවන හීය "වප්හීය" නමින්ද හඳුන්වයි.

හීයෙන් පසුව "අවකුට්ටි ගැසීමේ" වාරය පැමිණේ. එකතුවන පස් කුට්ටි අවකුට්ටි ලෙස හඳුන්වයි. අවකුට්ටි ගැසීමෙන් පසුව නොදිරු තණකොළ එකතු කිරිමට "අට්ඨදන්තක" නම් උපකරණයක් භාවිත කරයි. සමහරු එය "ඇණ දත් පෝරුව" ලෙසද හඳුන්වයි. ඉන් අනතුරුව පෝරුව රැගෙන පෝරු ගානු ලැබේ. හරකුන් ලවා කුඹුර පෑගවීම "මැඩවීම" නම් වේ. මේ අවස්ථාව වන විට කුඹුරක් කම්පස් කොට හමාරය.

කුඹුරු යායක් වපුරන්නට අරඹන්නේ එහි 'ඉහත්තාවේ' සිටය. පළමු කොට කුඹුරේ වතුර බස්සනු පිණිස ඇලවල් දමයි. ප්‍රථමයෙන් දමන්නේ 'මුදුන් ඇළයි' ඉන් අනතුරුව වැපිරීම සිදු කරයි. නියමිත දින ගණන් පසු වූ විට වී ඇටේමුල් ඇදි කනු කැජේය. වී ඇටේ අංකුර අවස්ථාව මෝදු වීමට 'කණු කැපීම' යිය කියති. දින තුනක වැනි කාලයක් තුළදි අංකුර මතුවන අතර පළමුවලා කෙතේ දිය බැඳිය යුතුය. මේ දිය බැඳීමට "ඉස්නාන් තෙමීම" යයි කියති. තෙදිනකට වරක් බැගින් තෙවරක් ඉස්නාන් තෙමා, ඉක්බිති උවමනා පරිදි දිය බඳියි. මේ දිය වරම 'වප්පැත' යිය කියනු ලැබේ.

ගොයම් පැළයක් බවට පත් වී තෙළන කල්හි 'තෙළීම' ඇරඹෙන්නේය. ගොයම් උගුලා අගින් කොළ කඩා දමා නැවතත් පිළිවෙලට සිටුවීම 'තෙළිම'

නමින් හඳුන්වයි. ඉන්දු ගොයම් පඳුරු දමා සශ්‍රිකව වැඩෙන්නට පටන් ගනී. එය 'හීන් දණ්ඩ', 'මහ දණ්ඩ', 'මල් වැරුම', 'පිදිම', 'කිරි වැදීම' යනාදි අවස්ථාවන් පසු කරයි. ගොයමට සතුරුකම් කරන්නන් බොහෝය. සතුන්ගෙන් සහ වැස්සේ අඩු වැඩිකම් එයින් ප්‍රමුඛස්ථානය ගනී. වල් පැළෑටි නෙලා දැමීම "නිද්දානය" නම් වේ. ඇල් කෙතක නම් මේ නෙලීමට "නෙලුම් ඇල්ලීම" යයි කියති.

ඇස්වහ, කටවහ, හෝවහ ආදියෙනුත් කුඹුරු ලෙඩවන බව ගොවියෝ විශ්වාස කරති. මේ සියල්ලටම භාවිත කරන කෙම් ක්‍රමද ඔවුන් අතර ඇත. එවායින් බොහොමයක් පාරම්පරික සිරිත් ලෙස ක්‍රියාවෙහි නංවයි.

වී ඇටයෙහි කිරි පිරෙන කාලයෙහි එයට මැස්සා ඇබ්බැහි වී ඒ කිරි උරා බීමේ රෝගය "සෙතවීඩිකා" නම් රෝගය වැළඳෙයි. කෙතට මෙවැනි රෝගයක් වැළඳුන විට සිදුකරන කෙම් ක්‍රම කිහිපයක් පෙන්වා දීමට පුලුවන. එනම්, "අං ඇදීම", "කුක්කා දානේ", "කෙම්පැළලි දැමීම", "ගම්මඩු නැටීම", "ගොප්මං ඇදීම", "ගොයම් කණු ගැසීම", "නැටියේ ගැසීම", "දෙවොල් නැටීම", "තව තිල්ල ", "පස්කිරි වත්කිරීම", "පැවිඉරට දෙන දානේ", "පොල් ගැසීම", "මඩ දානේ" ලෙස දැක්විය හැකිය. ගොයම් පැසී රතු වේගෙන එන කාලයෙහි උවදුරු බොහෝය. ගිරවිගෙන් කුඹුර රැකගැනීම ප්‍රධානය.

කෙත මේ උවදුරු වලින් රැකගැනීම උදෙසා "කැරැලි වැල්", "අප්පුඩි ලෑලී", "ගැටලණු", වකපෝරු ආදිය එල්ලා ඒවා නිරතුරු හොළවමින් "ඩොරි බොලේ ඩෝ හෝ, "කයියාගේ" යයි කියමින් කෑ ගැසිය යුතුය. මේවා විශේෂයෙන් දරුවන්ට අයත් රාජකාරි වේ. මොණරාගල ප්‍රදේශයේ "සකළයන් හැඹීම" යනුවෙන් හඳුන්වන්නේ මෙම ක්‍රියාවයි. රැට උෟරන්ගෙන් අලියන්ගෙන් ආරක්ෂා කර ගැනීමට "පැල් ලැග්ග" යුතුයි. එබැවින් ගොවියා කෙතේ පැළක් සාදනු ලැබේ. නිදි වරමින් සී පද කීම පැල් රකින්නාගේ කාර්යය වේ.


අම්මගේ සෙතේ උල්පත ගලනවා වගේ
අප්පගේ සෙතේ අකලට වහිනවා වගේ
ගොල්ලගේ සෙතේ පිරේන් ලෑ යනුනු වගේ
වෑයම් මිසක් නෑයන් මොටද කලි යුගේ

විදලා මරන වැදි රජෙකුත් නොවේ නම්
ඇනලා මරන කුඤ මීමෙක් නොවේ නම්
විකලා දමන සීහර දෙකුත් නොවේ නම්
දුවලා වෙහෙස නොගනින් ලදේ බය නම්

බඩේ කට විතර ඇත කුඹුරේ පර | වෙනි
පඹේ සේම කෙතකට බැන්ද වැහි | වැනි
ඔබේ ගෙදර ඇත්නම් මෙමට පුලු | වනි
ඉබේ කෙදිරි ගෑවේන ලෙඩකි බඩ | ගිනි

ගොවිහු පිළිගත් සුභ දිනයක 'කලේ ඇල්ලීම' නමින් චාරිත්‍රයක් සිදු කර ගොයම් කැපීමට 'කයියට' ආරාධනා කරනු ලැබේ. ඔවුහු ගොයම් කයියට සහභාගී වූයේ 'අත්තම් ක්‍රමටයට' ගමේ ප්‍රභූන්ගේ කයියට හෙවත් 'මුත්තෙට්ටුවට' ආරාධනා කරන්නේ ගමේ වැඩිහිටි පුද්ගලයෙකු විසින්ය. ඔහු 'කයි මුත්තා' වේ. බුඳුන් වැද කුඹුරට බසින ගොවියාගේ අතේ ලියන්නාව වේ. එක් වරකට කපා ඔසවා ගන්නා ගොයම් මිටි "උප්පිඩ" වන අතර එවැනි උප්පිඩ කිහිපයක් "මාස් පිඩ"ද මාස්පිඩ කිහිපයක් "කැටකන්ද" නමින්ද හඳුන්වයි. ගොයම් කොළයට සමානයෙන් කැට කඳු තිහක් පමණ අල්ලයි. කයිය සඳහා පැමිණෙන අයට දෙන ආහාරය "කයිබත, ඇඹුල, මුත්තෙට්ටුව හා වැදම" යන නම්වලින් හඳුන්වනු ලැබේ. ගොයම් මැඩීම සඳහා යොදා ගන්නා භූමිය කමත වේ.

කමතේ වතුර බැස යෑමට පහසු වීමට කානු කපනු ලැබේ. මෙම කානුව 'ගොම්මෝල්කඩ' හා 'ඇල්මෝල්කඩ' යන නම් වලින් හඳුන්වයි. කමත පිළියෙල කර අවසන් වූ පසු කමත පුරාම 'ගොම්මැටි ගෑම' සිරිතකි. ඒ අනුව 'අරක් තැබීම', 'අළුහත් තැබීම' හා "කොළ එළිම" ආදි චාරිත්‍ර කරනු ලැබේ. කමත මැද වළක් හාරා යම් යම් ද්‍රව්‍ය තැන්පත් කිරීම "අරක් තැබීම" වේ. එම වළ " අරක්වළ" වේ. අරක්වලේ ද්‍රව්‍ය තැන්පත් කරන්නේ 'අරක්කාරයා' විසින්ය. අළු වලින් සංඥා ලකුණු කිරීම 'අලුහත් වැඩීම' ලෙස හඳුන්වයි. ඉන් අනතුරුව කමතට ගොයම් දමා බැත වැඩීම සිදු කරනු ලැබේ. මේ සඳහා උකුණු ගස, යතුර, බෝල් අත, හා කෙවිට යන උපකරණය උපයෝගි කරගෙන දකුණු අත පැදකුණු කරනු ලැබේ.



කමතේ වැඩ සංවිධානය කිරීම "කමත ආණ්ඩු මට්ටු කිරීම" ලෙස හඳුන්වයි. ගවයන් යොදා කොළ මැඩවීම "කොළ ගොන් පෑගීම" නම වේ. හරක් කැරැල්ලේ ගවයන්ට "මුදුනා, කොළමුත්තා, ඈතුරය, මට්ටයා, කලාතයා" යන නම් භාවිත කරයි. (දළුපොත, (2002)13 පිටුව) හරක් දක්කවීමේදි අඩහැර පෑම හෙවත් "ඔසේ ඇදීම" සිදු කරයි. හරකුන් දැක්කීමේදි "අඩහැර පෑම" අවශ්‍යම අංගයක් විය. කමත් හැල්ලේ කවි කියන අතර "අඩහැර පෑම" හෙවත් "ඔසේ ඇදීම" කළ යුතුය. බිම් තැන්නේ ගොවියා "ගැහැකියනවා" යනුවෙන් හැඳින්වූයේද අඩහැර පෑමය.

''හෝ... හෝ... අම්මා...හෝ... හෝ... හැරිලා....
හෝ... හෝ... අම්මා... හේ... හේ.. දහ... දහ...
හෝ... හෝ.... අම්මා... කොළ මැඩපන් අම්මා...
හෝ... හෝ... අම්මා... හෝ... හෝ... හැරිලා''

මීට වඩා වෙනස් ආකාරයක අඩහැර පෑමක් රුහුණේ දි අසන්නට ලැබේ.

"ඔයි රයිරේ ඔයි රාමා
කොළ මැඩපන් ඔයි රාමා"

කමතේ වැඩ කරන අයට සපයන ආහාර වේල "කමත් ඇඹුල, මුත්තෙට්ටුව" යන නම් වලින් හඳුන්වන අතර පසුදා උදේ ආහාරය "හිල් අඩක්කුව" නම් වේ. අත්තම් ක්‍රමයට පදනම් කරගත් කයිය රටේ හැම පළාතකම සිදු වූ බව පැහැදිලිය. ඒ නිසාම අවශ්‍ය අයට ආරාධනා කළේ ගොවියාය. "තෙළුමට" ඇරයුම් කළේ ගෙවිළියයි. කමතට අවශ්‍ය ප්‍රමාණය අනුව පිරිසට ඇරයුම් කෙරේ. ඇඹුල දීම ඉතා සැලකිල්ලෙන් දියයුතු මංගල්‍යයක් වශයෙන් ගොවි සමාජය සැලකූ බව පෙනේ.

"මඟුලට වාගේ කෑම දියල්ලා"
"මඟුලක වැනි වූ බෝජන ඇත්තේ "
"ඇඹුලට දෙන දේ ලෝභ නොකරන්නේ "

යන ජන කවි පද වලින් මොනවට පැහැදිලි වේ. කොළ මැඩීම අවසන් කළ පසු "කොළ හැලීම" ආරම්භ කරයි. ඉන්පසු බැත ආරුව කෙග්ගා කාටුව ඉවත් කරනු ලැබේ. "කාටුව ගැසීම" ඊට නමකි. ඉතා හොඳින් කාටුව ගසා රිටි මාන් තබා කාටුව අයින් කිරීමෙන් පසු කමත් තෙළුමේ කටයුතු අවසන් වේ. ඉන් අනතුරුව අවසානයේ අස්වැන්න තැන්පත් කරනු ලැබේ. වක් අත් ගැසීමේ සිට අස්වැන්න තෙලා කොටුවල ලෑම දක්වා සිදුවන ක්‍රියාවලිය සද්ධර්ම රත්නාවලියේ දක්වා ඇත්තේ මෙසේය.

"පළමුකොට කුඹුරු ගෙඩවිය යුතුය. ඉක්බිති බිම් නැගිය යුතුය. පසුව දෙසීසැම යුතුය. මියර කෙටිය යුතුය. ඉස්සත් තෙම්ය යුතුය. දිය බැන්ද යුතුය. ගොයම් රෝගයට කෙම් නළ යුතුය. ගොයම් පැසි ගිය කළ වැඩි වී අටුකොටු වල ලිය යුතුය"

මෙලෙස ගොවියා තුළ ජනිත වන්නාවූ අදහස් හා හැගීම් ප්‍රකාශ කිරිම උදෙසා වචන කලාව උපයෝගි කරගනු ලැබේ. එමෙන්ම ද්‍රව්‍යමය මාධ්‍ය උපයෝගි කොට ගත හැකිය. අභිනය හෝ දෘශ්‍යය මාධ්‍ය උපයෝගි කොට ගතහැකිය. ඒ කුමක් උපයෝගි කරගනු ලැබුවද ප්‍රකාශ වන්නේ සමූහයටම පොදු අදහස් හා හැගීම් නම්, ඒවා සමාජයේ පිළිගැනීමට පත් වීමෙන් මුඛ පරම්පරාගතව පරපුරෙන් පරපුරට පැවත ඒමයි. අපි ඒවා අද ජනශ්‍රැතිය තුළ එන ජනවහර ලෙස අධ්‍යයනය කරනු ලැබේ. එය ගොවියාට පමණක් නොව සකලවාසි මානව ප්‍රජාවගේම අදහස් සන්නිවේදනය කිරිම සදහා උපයෝගි කරගනු ලබන සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමවේදයකි. මෙම ජනශ්‍රැතිය යටතේ අධ්‍යයනය කරනු ලබන ජනවහර උපසංස්කෘතිය තුළ ප්‍රධාන මෙවලමක් ලෙස සැලකිය හැකිය. මන්ද මානවයා අන්‍යෝන්‍ය වශයෙන් තොරතුරු සන්නිවේදනය කරනු ලබන්නේ මෙම භාෂාව පදනම් කරගෙනය.

භාෂාව යනු මිනිස් වර්ගයා විසින් සිය අදහස් ප්‍රකාශනයෙහිලා යොදාගනු ලබන ඉතාම ශක්ති සම්පන්න මාධ්‍යයි. ජනතාව සතු භාෂාව ජන විද්‍යාත්මක ලෙස හැදෑරීමෙන් එහි පවත්නා ප්‍රබලතා සේම දුබලතාද මැනවින් හදුනාගත හැකිය. එවිට සන්නිවේදන මාධ්‍යයක් සේ භාෂාවේ පවත්නා ප්‍රබලතාව ද බෙහෙවින් වැඩිවනු ඇත. එමෙන්ම භාෂාව අවස්ථානුකූලව පරිසරය අනුව වෙනස්වන ආකාරය මෙම කෘෂිකර්මාන්තය හා බැඳි භාෂාව නිදසුන් ලෙස අවධාරණයට ගත හැකිය. ඒ අනුව කෘෂිකර්මාන්තය හා බැදි උපසංස්කෘතික භාෂාව අධ්‍යයනය හුදෙක් භාෂණය පිළිබඳ අධ්‍යයනයක් පමණක් නොව ප්‍රාදේශීය විවිධතා, සමාජ ස්තර, ආර්ථික හා සංස්කෘතික වෙනස්කම්ද පිළිබිඹු කරන්නක් ලෙස ද දක්විය හැකිය.

භාෂණය හෙවත් කටවහර අවස්ථානුකූලව පරිසරයට අනුව වෙනස්වනු දකිය හැකිය. මේ හේතුව නිසා ජනවහර අධ්‍යයනය හුදෙක් භාෂණය පිළිබඳ අධ්‍යයනයක් පමණක් නොව ප්‍රාදේශීය විවිධතා, සමාජ ස්තර, ආර්ථික හා සංස්කෘතික වෙනස්කම්ද පිළිබිඹු කරන්නකි. කවර භාෂා සමාජයක වුවද ඒ ඒ පුද්ගල කණ්ඩායම්වලට හා ප්‍රාදේශීය වශයෙන් සීමා වූ ව්‍යවහාර ප්‍රභේද ජනිත වී ඇත. (මානවඩු, 2006,26 පිටුව) මේ ආකාරයට ගොවි ජනයාගේ ජීවිතය හා කෘෂි කර්මාන්තය හා අත්‍යන්තයෙන් බැඳි උප සංස්කෘතික භාෂාව ජනවහරක් බවට පත් වී ඔවුන්ගේ සිතුම් පැතුම් දුක්ඛ දෝමනස්සයන්, හැඬුම් වැළපුම් පමණක් නොව ඔවුන්ගේ ජීවන දර්ශනයද කියා පාන කැඩපතක් වේ.

මෙම උපසංස්කෘතින් ඔස්සේ බිහිවන ජන වහර සකස් වී ඇත්තේත් ඔප මට්ටම් වී ඇත්තේත් පොදු ජන ජීවිතයෙන්ම උකහා ගත් අත්දැකීමෙන් හා අරුතින් හෙයින්, පත පොතේ එන කිසියම් වහරක දක්නට නොලැබෙන තරමේ භාවිත ගුණයකින්ද, ව්‍යංගාර්ථයකින්ද ජනවහර පෝෂණය වී ඇති බව හෙළි වේ. (දිසානායක. 1976, හැඳින්වීම 10 පිටුව) සීසෑමේදි නගුල භාවිත කල බවටත්, එය අත්‍යවශ්‍ය උපකරණයක් බවටත් පත්ව තිබූ බවට කදිම සාක්ෂි අපට ජනවහර තුළින්ම සොයාගත හැකිය. හත් කෝරළේ පුරාණ ජනසම්මත කියමනක් වන "නගුලේ රඟ දුනේ කැකුළං හාන දොහේ" යන්නෙන් එය මනාව පැහැදිලි වේ.

කෘෂිකර්මික උප සංස්කෘතිය පිළිබඳව විද්‍යාත්මක ලෙස සොයා බලන්නට ද මෙම උප සංස්කෘතික භාෂාව හා ඒ ඔස්සේ ගොඩ නැගී ඇති ජනවහර මහෝපකාරී වී ඇත. එම බස්වහර කෘෂිකාර්මික උප සංස්කෘතියේ පදනම වේ. එම උප සංස්කෘතික රටාව පවත්වාගෙන යා හැක්කේ බස්වහර උපයෝගී කොටගෙනය. එබැවින් කෘෂිකාර්මික උප සංස්කෘතියේ නියම ස්වරූපය හිඳුනාගැනීමට එම උප සංස්කෘතිය ඔස්සේ බිහි වූ බස්වහර හැදෑරීම අත්‍යවශ්‍යම කාරණාවක් වේ.

සී සෑම පිළිබඳව කෘෂිකාර්මික ජන ජීවිතය ඔස්සේ ම ගොඩ නැගුණු ජන වහරේ එන ඇතැම් ව්‍යවහාරික පද ඔස්සේ මනාව පැහැදිලි කරනු ලැබේ. "හානා හීය පානා අඬහැරෙන් දුනේ" කියනවා සේම,"හීයට නැති අඬහැරේ සීලෙට යැ" යනුවෙන්ද භාවිත වේ. මෙවැනි ප්‍රකාශ තුළින් ගැමි ජනතාවගේ කෘෂිකාර්මික සංස්කෘතික රටාව හදාරන විද්‍යාර්ථීන්ට ජනවහරින් ලද හැක්කේ මහත් රුකුලකි. අනෙක් අතට භාෂාව හා සමාජය අතරේ පවතින ඉතා දෘඩ සම්බන්ධතාවය අධ්‍යයනය කිරීමට ද මෙම උප සංස්කෘතික භාෂාව ඔස්සේ ගොඩ නැගෙන ජනවහර පිහිට වේ.

මේ ආකාරයට කෘෂිකර්මාන්තය සමඟ ගොඩ නැගෙන උප සංස්කෘතියේ භාෂාව පිළිබඳ විග්‍රහයක් කළ හැකිය. නව තාක්ෂණයත්, වාණිජත්වයත් නිසා අපේ ජාතික සම්පතක් වූ මෙම උප සංස්කෘතික භාෂාව කුඹුරෙන් සමුගනිමින් තිබීමය. එහෙයින් මෙසේ මැකී යමින් පවතින භාෂාව අනාගත පරපුර වෙනුවෙන් ආරක්ෂා කර තැබීම යුගයේ අවශ්‍යතාවක් වනු ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**


- වීරසූරිය, ගුණසිරි. (2006). සිංහල සමාජය හා සංස්කෘතිය. ආරිය පබ්ලිකේෂන්.
- කුලරත්න, සාලිය. (2006). සන්නිවේදනය හා ජනශ්‍රැතිය. ආරිය පබ්ලිකේෂන්.
- මැදඋයන්ගොඩ, විමලකීර්ති හිමි. (2002) සිංහල ගොවිතැන

- දනන්සූරිය, ජිනදාස. (2002). ජනශ්‍රැති අධ්‍යයන. පියසිරි ප්‍රින්ටින් සිස්ටම්. නුගේගොඩ.
- දළුපොත, මහින්ද කුමාර. (2002) . නගුලේ වගතුග. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.
- දළුපොත,මහින්ද කුමාර. (2001). ගමේ වගතුග. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.
- දළුපොත, මහින්ද කුමාර. (2001). වැවේ වගතුග. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.
- දළුපොත, මහින්ද කුමාර. (2001) .කෙතේ වගතුග. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.
- දළුපොත, මහින්ද කුමාර. (2002). කමතේ වගතුග. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.
- දළුපොත, මහින්ද කුමාර. (2002) . හේනේ වගතුග. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.
- පොඩි අප්පුහාමි, කේ. බී. (2002). රටරටින් ගිලිහි යන ගැමි ජිවන රටා. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.
- විමලවංශ නාහිමි, බද්දේගම. (2000). අපේ සංස්කෘතිය. සමයවර්ධන පොත්හල, 63, මාළිගාකන්ද පාර, මරදාන.
- දිසානායක, ජේ. බී. (1976).සිංහල ජනවහර. සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් සහ සමාගම.
- අමුණුගම, සරත්. (1999). සංස්කෘතිය සමාජය හා පරිසරය. සදීපා පොත් සමාගම, කොළඹ.
- මානවඩු, සුසිරිපාල. (2006). ජනවහරේ වියත් ලකුණු. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.